දුරකථන ) 0112669192 , 0112675011
தொலைபேசி ) 0112698507 , 0112694033
Telephone ) 0112675449 , 0112675280

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax ) 0112692913

විද්‍යුත් තැපෑල ) postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )
e-mail )

වෙබ් අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA
සෞඛ්‍ය අමාත්‍යාංශය
சுகாதார அமைச்சு
Ministry of Health

මගේ අංකය )
எனது இல ) MH/TA/18/TUT/RG 01/2023
My No. )

ඔබේ අංකය )
உமது இல )
Your No. : )

දිනය )
திகதி ) 2023.06. 27
Date )

General Circular Letter No : 02 – 84 / 2023

All Directors of Hospitals and Heads of Institutions under the Line Ministry,

**<u>Recruitment to the post of Senior Tutor in Radiographer in School of Radiography of Ministry of Health</u>**

Applications are called from the Tutor Radiographers who have satisfied the following qualifications and conditions, serving at the School of Radiography under the Ministry of Health for recruitment to the post of Senior Tutor Radiographer at the School of Radiography under the Ministry of Health.

**1. Educational and Other Qualifications :-**

I) Should be a citizen of Sri Lanka.

II) Should be excellent in character.

III) Should be an officer in Supra Grade of the Post of Tutor Radiographer or an officer who have completed an active service period of five (05) years in Grade I.

IV) Should not have been subject to a disciplinary punishment as per the provisions set out in public service commission circular No 01/2020

V) Should have shown a performance at the satisfactory level or above the satisfactory level during the five (05) years immediately prior to the date of promotion in terms of the approved scheme of performance appraisal.

VI) Should have passed the Efficiency Bar Examination for Grade I

VII) Should have successfully completed 06 month training course in teaching conducted by the National Institute of Health Science or should have followed a course in teaching of not less than

six months recognized by the Tertiary and Vocational Education Commission or University Grants Commission.

VIII) Should have fulfilled all qualifications in all respects as at the date mentioned here in and candidates should submit copies of the relevant certificates along with the application in proof of the qualifications.

**2. Age Limit:-**

Maximum age limit is not applicable since recruitments are made from the officers who are currently serving in the post of Tutor in Radiographer.

**3. Salary Scale :-**

In terms of the Public Administration Circular 03/2016 dated 25.02.2016 salary code applicable to this post is MT 08 - 2016 and the appointee will be placed on the third salary step of the salary scale Rs. 50,200- 10 x 1345 – 08 x 1630 - 76,690/= .

**4. Method of Recruitment:-**

Applications are called in terms of the notification of calling applications approved by the Health Service Committee of Public Service Commission considering the number of vacancies. Qualifications of the candidates are verified by an eligibility evaluation interview conducted by an interview board approved by the Health Service Committee of the Public Service Commission Candidate who secure the highest marks at the interview will be appointed by the Health Service Committee of Public Service Commission in the order of merit of the marks and considering the number of vacancies. A number of candidates constituting twice the number of vacancies or five (05) candidates; whichever the highest in number will be called for the interview in the order of seniority of the officers.

Note – When the officers promoted by the Health Service Committee of Public Service Commission are attached to service stations, they will be given opportunity in the order of merit obtained at the eligibility evaluation interview to mark their choice for the vacancies exist in the approved cadre in the order of their preference and recruited.

## 5. Marking Scheme:-

| | | |
|---|---|---|
| i. Service Experience | - | 60 Marks |
| ii. Additional Educational Qualification | - | 30 Marks |
| iii. Special Merits | - | 10 Marks |
| Total | = | 100 Marks |

*** Comprehensive marking scheme is attached as Annexure I.

## 6. Conditions of Service :-

This post is permanent and pensionable. Appointee should further contribute to the Widows'/ Widowers' and Orphans' Pension Scheme. Since this recruitment is made on the limited basis, appointee is subject to an acting service period of one year.

## 7. Method of applications :-

I. Applications should be prepared in compliance with the specimen form of application appended to this notification and the applications completed by the applicants should be forwarded to the Head of Institution. The Head of Institution, having satisfied with the accuracy of information furnished in the application after checking them with the records in the personal files of the officers concerned, should certify the applications. It will be the responsibility of the Head of Institution.

II. Top left corner of the envelop containing the application should bear the words **"Recruitment to the post of Senior Tutor in Radiographer in School of Radiography of the Ministry of Health"**

III. Heads of Institutions should forward the duly perfected applications together with the report given at the end of the application by registered post to reach the Director (Admin) 02, Ministry of Health, " Suwasiripaya" , No. 385, Rev. Baddegama Wimalawansa Thero Mawatha, Colombo 10 on or before ..25...07...2023

IV. **Applications received after the closing date of applications or applications containing incorrect information will be rejected without any notice.** Appeals made subsequently in this regard will not be entertained. Ministry of Health, will not be responsible of the losses in the post.

**8.** Documents in proof of the qualifications given under No. 01 and No. 05 above, if any, should be attached to the application. No consideration will be made regarding the candidates who fail to furnish the documents when necessary.

9. Selected candidates should accept the appointment by short notice as no additional expenses has to be incurred by the Government and should be willing to serve in any place he/she is appointed to. If the appointee fails to do so appointment has to be cancelled after 14 days.

10. In case of any problem regarding any matter covered or not covered by this circular decision of the Health Service Committee of the Public Service Commission will be final. And, in the event of any inconsistency between the Sinhala, Tamil and English texts of this circular, Sinhala text will prevail.

**N.B. – Head of Institution should personally draw his/her attention to the fact that every section of the application is perfected and information furnished is correct.**

By the order of the Health Service Committee in the Public Service Commission,

S. Janaka Sri Chandraguptha
Secretary
Ministry of Health
"Suwasiripaya"
385, Rev. Baddegama Wimalawansa Thero Mawatha,
Colombo 10.

S. Janaka Sri Chandraguptha,
Secretary,
Ministry of Health.

## Specimen Form of Application

## Recruitment to the Post of Senior Tutor in Radiographer in Schools of Radiography of the Ministry of Health.

**Part 01 - To be filled by the relevant officer himself/ herself**

01. Name of the officer with initials: - ..........................................................................................

02. Full Name : - ..........................................................................................................

03. National Identity Card No: - .......................................... Tele. No .......................................

04. Service Station: - .....................................................................................................

05. Date of recruitment to the training :- .....................................................................

06. Post held in Segment II "B" and date of appointment to the post:-....................................

07. Date of promotion to Segment II "A" :- ...................................................................

08. Date of promotion to Grade I : - ..................................................................................

09. Date of Promotion to Supra Grade : - ...........................................................................

10. Present Grade and date of promotion to the present Grade :- .............................................

11. Experience From ........................................... To............................................. in teaching

12. Date of appointment to the Tutor post : - .................... (ii) Duty report Date: - ....................

13. a) Has the officer earned all increments during the period of five (05) years immediately prior to the closing date of applications.

2018 ..........................................................................................................................

2019 ..........................................................................................................................

2020 ..........................................................................................................................

2021 ..........................................................................................................................

2022 ..........................................................................................................................

b) If not earned, reasons :- ..........................................................................................

..........................................................................................................................

c) As per the approved performance reports, the level of performance in the following years should be clearly stated as Very Good/ Good/ Satisfactory/ Unsatisfactory. Should be placed Signature and official frank of the evaluator and the appraiser. (Attach the Copies)

2018 ....................................................................................................................

2019 ....................................................................................................................

2020 ....................................................................................................................

2021 ....................................................................................................................

2022 ....................................................................................................................

14. Particulars of the no-pay leave, obtained by the officer during the period of five (05) years immediately prior to the closing date of applications.

a) If the officer has obtained maternity leave on no pay, mention the relevant period :-

..................................................................................................................

..........................................................................................................................

b) If the officer has obtained other leave on no – pay mention the relevant period & reasons:-

..........................................................................................................................

..........................................................................................................................

15. a) Has the officer been subjected to any disciplinary inquiry or disciplinary punishment during the period of 05 years immediately prior to the closing date of application? :-

..........................................................................................................................

b) If any, mention particulars,: - ..........................................................................................

I hereby certify that above particulars are true and correct and also I am aware if any information furnished herein is found to be incorrect or false before selection I am liable to be disqualified and if found so after appointment I am subject to be dismissed from service without any compensation.

| | |
|---|---|
| .............................. | ........................................................ |
| Date | Signature of the Applicant |

**Part - 02 Recommendation of the immediate Supervising Officer.**

I recommend this officer ..................................................................... who is serving in the post of Radiographer under my supervision to appoint to the post of Senior Tutor in Radiographer in the School of Radiography if he/she has fulfilled the required qualifications.

.................................... 
Date

...................................................................... 
Official Stamp and Signature of the Officer in Special Grade / Head of the Institution.

**Part 03 - To be filled by the Officer- in charge of the subject referring to the personal file of the officer concerned.**

I certify that all particulars furnished in the application from No.01 to No. 10 are correct according to the personal file of the officer.

.................................... 
Date

...................................................................... 
Signature of the Officer in –charge of the subject

**Part 04 – Recommendation of the Administrative Officer: -**

I hereby certify that all particulars furnished in the application of the officer concerned from No. 01 – 10 are correct. The application is recommended.

.................................... 
Date

...................................................................... 
Signature and official stamp of the Administrative Officer

**Part 05 - Recommendation of the Head of the Institution:-**

I hereby certify that all the above particulars of Mr./Mrs./Miss. ................. ........................................................................................................................ who is in the post of Radiographer are correct and that he/she has been promoted to Grade I or Supra Grade of the post of Radiographer on ............................................................ I recommend this application for the post of Senior Tutor in Radiographer of the School of Radiography which belongs to the Service of Professions Supplementary to Medicine.

.................................... 
Date

...................................................................... 
Signature and official stamp of the Head of Institution

## Annexure I

## Comprehensive Marking Scheme for Recruitment to the Post of Radiographer of the School of Radiography.

**01) Service Experience**

In terms of the Public Service Commission 01/ 2019, the Officer with the highest period of service in addition to the minimum service period required for fulfilling basic qualification, should be awarded the total marks allocated for seniority whereas the other officers be awarded marks proportionately for the additional period of Service.

**- Maximum 60 Marks-**

**02) Additional Educational Qualifications**

2.1 For post – graduate degree awarded by an institute recognized by the University Grants Commission

i. Master of Philosophy/ Doctor of Philosophy in the field concerned - 30 Marks

ii. Post graduate Degree in the field concerned - 25 Marks

iii. Post graduate Degree in Management or Post graduate Degree in Information Technology - 15 Mraks

2.2 Degree awarded by an institute recognized by the University Grants Commission

i. Degree in the field concerned - 15 Marks

ii. Degree in Management or Degree in Information Technology - 10 Mraks

2.3 For a Course offered by an institute recognized by the University Grants Commission which is not less than 72 hours or 06 months (Marks will not be given for the courses considered educational and other basic qualifications)

i. Any other Diploma in the field concerned - 7.5 Marks

ii. Diploma in Management or Diploma in Information Technology - 2.5 Marks

**- Maximum 30 Marks -**

Note - Marks will be given **only** for the highest qualification under above 02

**03) Special Merit**

Marks should be given according to the Criteria given in Annexure II in evaluations Scientific Research Publications, books, articles published in newspapers, instructions and guidance, journal papers, conference papers, abstracts published on the field relevant to the profession concerned. In the interview evaluation sheet, if should be clearly mentioned the method of evaluation used at the interview.

**- Maximum 10 Marks -**

## ANNEXURE II

**Guidelines to evaluate Publications :**

I. Publications :

(a) Journal Papers – An academically important essay or article with a full copy which was reviewed and published in a series of a numbered publication.

(b) Conference Papers/ abstracts/ final essays.

Reports, which were circulated at academically important conferences, congresses, seminars, colloquiums, forums, workshops or symposiums.

II. In the case of publications with joint authorship, applicant's proportionate should be indicated and their actual contribution to the work published should be established and marks should be allocated accordingly.

III. Publications which are based on same data/ research material where the contents of the publications have a high similarity index will not be considered as separate publications. Only one of the publications shall be eligible to earn marks.

දුරකථන ) 0112669192 , 0112675011
தொலைபேசி ) 0112698507 , 0112694033
Telephone ) 0112675449, 0112675280

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax ) 0112692913

විද්‍යුත් තැපැල ) postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )
E-mail )

වෙබ් අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේ අංකය ) MH/ TA/ 18/ TUT/
My No. ) RG/ 01/ 2023

ඔබේ අංකය )
உமது இல )
Your No. )

දිනය )
திகதி ) 2023.06. 27
Date )

# සෞඛ්‍ය අමාත්‍යාංශය
# சுகாதார அமைச்சு
# Ministry of Health

පොදු චක්‍රලේඛ ලිපි අංක:- 02 – 84 / 2023

රේඛීය අමාත්‍යාංශයට අයත් සියලුම රෝහල් අධ්‍යක්ෂවරුන් හා ආයතන ප්‍රධානීන්,

<u>සෞඛ්‍ය අමාත්‍යාංශයේ විකිරණ ශිල්පී පුහුණු පාසල සඳහා ජ්‍යෙෂ්ඨ ආචාර්ය විකිරණ ශිල්පී තනතුරට බඳවා ගැනීම</u>

සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ පාලනය වන විකිරණ ශිල්පී පුහුණු පාසල සඳහා **ජ්‍යෙෂ්ඨ ආචාර්ය විකිරණ ශිල්පී තනතුරට** පහත සඳහන් සුදුසුකම් හා කොන්දේසි සපුරා ඇති සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ පාලනය වන විකිරණ ශිල්පී පුහුණු පාසලේ සේවයේ නියුතු ආචාර්ය විකිරණ ශිල්පී නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**1. අධ්‍යාපන හා වෙනත් මූලික සුදුසුකම් :-**

I. ශ්‍රී ලංකා පුරවැසියෙක් විය යුතුය.
II. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
III. විකිරණ ශිල්පී ආචාර්ය තනතුරෙහි අධි ශ්‍රේණියේ නිලධාරියෙකු වීම හෝ I වන ශ්‍රේණියේ වසර 05ක සක්‍රිය සේවා කාලයක් සහිත නිලධාරියෙකු වීම.
IV. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.
V. අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස්වීම් දිනට පෙරාතුව වූ වසර පහ (05) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබිය යුතුය.
VI. පළමුවන ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වී තිබිය යුතුය.
VII. ජාතික සෞඛ්‍ය විද්‍යායතනය විසින් පවත්වනු ලබන ඉගැන්වීම පිළිබඳ මාස 06 ක පුහුණු පාඨමාලාව සාර්ථකව නිමකර තිබීම හෝ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන මාස 06 කට නොඅඩු ඉගැන්වීම් පිළිබඳ පාඨමාලාවක් හදාරා තිබිය යුතුය.
VIII. අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට සඳහන් කරනු ලබන දිනට සියළුම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය. එමෙන්ම, අයදුම්කරුවන් විසින් සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාල සහතිකවල පිටපත් අයදුම්පත සමඟ ඉදිරිපත් කළ යුතුය.

**2. වයස් සීමාව**

බඳවා ගැනීම් සිදු කරනුයේ විකිරණ ශිල්පී ආචාර්ය තනතුරුවල දැනටමත් සේවයේ නියුක්ත ජ්‍යෙෂ්ඨ නිලධාරීන් අතුරින් බැවින් උපරිම වයස් සීමාව අදාල නොවේ.

## 3. වැටුප් පරිමාණය

2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 ට අනුකූලව මෙම තනතුරට අදාළ වැටුප් කේත අංකය MT 08 - 2016 වන අතර, රුපියල් 50,200- 10 × 1345- 08 × 1630 -76,690/- වැටුප් පරිමාණයේ තුන්වන වැටුප් පියවරෙහි තබා වැටුප් ගෙවනු ලැබේ.

## 4. බඳවා ගැනීමේ ක්‍රමය:

තනතුරු වල පවතින පුරප්පාඩු අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුව විසින් අනුමත කරනු ලැබූ අයදුම්පත් කැඳවීමේ නිවේදනයට අනුව අයදුම්පත් කැඳවා සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා එම කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක් පවත්වා ඉහලම ලකුණු ලැබූවන්ගේ ලකුණුවල කුසලතා අනුපිළිවෙල හා පුරප්පාඩු අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුව විසින් පත්කරනු ලැබේ. අදාල තනතුරු දරණ නිලධාරීන්ගේ ජ්‍යෙෂ්ඨතා අනුපිළිවෙල අනුව පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් හෝ පස් (05) දෙනෙකු යන දෙකෙන් වැඩි සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

> සටහන : රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුව විසින් උසස් කරනු ලබන නිලධාරීන් සේවා ස්ථාන වෙත අනුයුක්ත කිරීමේදී යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදී ලබාගනු ලැබූ කුසලතා අනුපිළිවෙල අනුව අනුමත සේවක සංඛ්‍යාවේ පවතින පුරප්පාඩු සඳහා ඔවුන්ගේ කැමැත්තේ අනුපිළිවෙලට මනාපය ලකුණු කිරීමට අවස්ථාව ලබාදී බඳවා ගනු ලැබේ.

## 5. ලකුණු දීමේ ක්‍රමය:

| | | |
|---|---|---|
| I. | සේවා පළපුරුද්ද | - ලකුණු 60 |
| II. | අතිරේක අධ්‍යාපන සුදුසුකම් | - ලකුණු 30 |
| III. | විශේෂ කුසලතාවයන් | - ලකුණු 10 |
| | එකතුව | - ලකුණු 100 |

*****විස්තරාත්මක ලකුණු දීමේ පරිපාටිය ඇමුණුම I ලෙස අමුණා ඇත.**

## 6. සේවා කොන්දේසි:

මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු/ වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට තවදුරටත් දායක මුදල් ගෙවිය යුතුය. සීමිත පදනම මත සිදුකරනු ලබන බඳවා ගැනීමක් බැවින් එක් අවුරුදු වැඩබැලීමේ සේවා කාලයකට යටත් වේ.

## 7. අයදුම්පත් එවිය යුතු පිළිවෙල :-

I. අදාල අයදුම්පත්‍ර මේ සමඟ අමුණා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව පමණක් සකස් කළ යුතු අතර, අයදුම්කරුවන් විසින් සම්පූර්ණ කරනු ලබන එම අයදුම්පත් තම ආයතන ප්‍රධානීන් වෙත ඉදිරිපත් කළ යුතුය. ආයතන ප්‍රධානීන් විසින් තමන්ට ලැබෙන අයදුම්පත්වල සඳහන් කරුණු අදාල නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනුවල ඇතුලත් වාර්තා සමඟ සසඳා බලා නිරවද්‍යතාවය පිළිබඳ සෑහීමට පත්වීමෙන් අනතුරුව සහතික කළ යුතුය. එය ආයතන ප්‍රධානීන්ගේ වගකීමක් ද වනු ඇත.

II. අයදුම්පත් බහාලන ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරෙහි **"සෞඛ්‍ය අමාත්‍යාංශයේ විකිරණ ශිල්පී පුහුණු පාසලේ ජ්‍යෙෂ්ඨ ආචාර්ය විකිරණ ශිලපී තනතුරට බඳවා ගැනීම"** යනුවෙන් සඳහන් කළ යුතු වේ.

III. අයදුම්පතේ අවසානයේ සඳහන් වන වාර්තාව ද සමඟ සම්පූර්ණ කරන ලද අයදුම්පත්, ආයතන ප්‍රධානීන් විසින් 2023.07.25..... දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් අධ්‍යක්ෂ (පාලන) 02, සෞඛ්‍ය අමාත්‍යාංශය, "සුවසිරිපාය", නො. 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10 යන ලිපිනයට එවිය යුතුය.

IV. **<u>ප්‍රමාද වී ලැබෙන හෝ වැරදි තොරතුරු සහිත අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.</u>** ඒ සම්බන්ධව පසුව ඉදිරිපත් කරනු ලබන අභියාචනා ද සලකා බලනු නොලැබේ. තැපෑලේ දී සිදුවන අස්ථානගතවීම් පිළිබඳ අමාත්‍යාංශය වග කියනු නොලැබේ.

**08.** ඉහත අංක 01 හා 05 යටතේ සනාථ කළ යුතු ලිපිලේඛන කිසිවක් වේතොත් ඒවා අයදුම්පතට ඇමිණිය යුතුය. අවශ්‍ය වූ විටෙක ලිපිලේඛන ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයින් පිළිබඳව සලකා බලනු නොලැබේ.

**09.** පත්වීම් සඳහා තෝරා ගනු ලබන අයදුම්කරුවන් රජයට අතිරේක වියදමක් නොවන පරිදි කෙටි දැනුම්දීමකින් පත්වීම භාරගත යුතු වන අතර, පත්වීම ලැබෙන ඕනෑම ස්ථානයක සේවය කිරීමට සූදානම්ව සිටිය යුතුය. එසේ ක්‍රියාත්මක විය නොහැකි පත්වීම්ලාභියෙකු වේ නම්, දින 14 කින් අනතුරුව පත්වීම අවලංගු කිරීමට සිදුවන බව දැනගත යුතුය.

**10.** මෙම චක්‍රලේඛය මඟින් ආවරණය වන හෝ නොවන යම් කරුණක් සම්බන්ධයෙන් හෝ යම් ගැටලු සහගත තත්වයක් උදා වුවහොත්, ඒ පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුවේ තීරණය අවසන් තීරණය වනු ඇත. එසේම, මෙම චක්‍රලේඛයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පාඨ අතර යම් පරස්පරතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු වන්නේය.

❖ සැලකිය යුතුය :-

**අයදුම්පතේ සෑම වගන්තියක්ම සම්පූර්ණ කර ඇති බව සහ එම තොරතුරුවල නිරවද්‍යතාවය පිළිබඳ ආයතන ප්‍රධානියාගේ පෞද්ගලික අවධානය යොමු විය යුතුය.**

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුවේ නියමය පරිදි,

එස්. ජනක ශ්‍රී චන්ද්‍රගුප්ත,
ලේකම්,
සෞඛ්‍ය අමාත්‍යාංශය

එස්. ජනක ශ්‍රී චන්ද්‍රගුප්ත
ලේකම්
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

ආදර්ශ අයදුම්පත

සෞඛ්‍ය අමාත්‍යාංශයේ විකිරණ ශිල්පී පුහුණු පාසලේ ජ්‍යෙෂ්ඨ ආචාර්ය විකිරණ ශිල්පී තනතුරට බඳවා ගැනීම

**1 කොටස : අදාළ නිලධාරිණිය / නිලධාරියා විසින් සම්පූර්ණ කළ යුතුය.**

1. නිලධාරියාගේ / නිලධාරිනියගේ මුලකුරු සමඟ නම :- ..........................................................................................
.................................................................................................................................................
2. සම්පූර්ණ නම :- ..................................................................................................................
.................................................................................................................................................
3. ජාතික හැඳුනුම්පත් අංකය :- ..................................................දු.ක. අංකය...............................................
4. සේවා ස්ථානය :- ..................................................................................................................
5. පුහුණුවට බැඳුණු දිනය :- ..........................................................................................................
6. II "ආ" ඛණ්ඩයේ තනතුර හා එම තනතුරට පත්වීම් ලද දිනය:- ..........................................................
7. II "අ" ඛණ්ඩයට උසස් වූ දිනය:-.................................................................................................
8. I ශ්‍රේණියට උසස් වූ දිනය:-........................................................................................................
9. අධි ශ්‍රේණියට උසස් වූ දිනය:-...................................................................................................
10. වර්තමාන ශ්‍රේණිය හා එම ශ්‍රේණියට උසස් වූ දිනය : - ................................................................
11. ඉගැන්වීම පිළිබඳ පළපුරුද්ද :- ................................ දින සිට ........................................ දින දක්වා
12. ආචාර්ය තනතුරට පත්වූ දිනය :- ................................ (ii) වැඩ බාරගත් දිනය :- ...............................
13. (අ) අයදුම්පත් කැඳවන අවසාන දිනට පූර්වාසන්න වසර (05) ක් තුළ සියලු වැටුප් වර්ධක නියමිත දිනට උපයාගෙන තිබේද? :- (ඔව්/නැත) ..............................................................................
    2018...........................................................................................................
    2019...........................................................................................................
    2020...........................................................................................................
    2021...........................................................................................................
    2022...........................................................................................................

    (ආ) උපයාගෙන නොමැති නම් ඊට හේතු :-

    ...............................................................................................................
    ...............................................................................................................

(ඇ) අනුමත කාර්ය සාධන වාර්තා අනුව පහත වර්ෂවල කාර්ය සාධන මට්ටම ඉතා හොඳයි/ හොඳයි/ සතුටුදායකයි/ අසතුටුදායකයි ලෙසට පැහැදිලිව සටහන් කර තිබිය යුතුය. ඇගයුම්කරුගේ හා ප්‍රමාණකරුගේ අත්සන, නිලමුද්‍රාව තිබීම අනිවාර්ය වේ. (පිටපත් අමුණන්න.)

2018......................................................................................................................

2019......................................................................................................................

2020......................................................................................................................

2021......................................................................................................................

2022......................................................................................................................

14. අයදුම්පත් කැඳවන අවසාන දිනට පූර්වාසන්න වූ වසර පහ (05) ක සේවා කාලය තුළ, ලබාගෙන ඇති වැටුප් රහිත නිවාඩු පිළිබඳ විස්තර

(අ) වැටුප් රහිත ප්‍රසූත නිවාඩු ලබා තිබේ නම් අදාල කාලවකවානු

..........................................................................................................................................

(ආ) වෙනත් වැටුප් රහිත නිවාඩු ලබා තිබේ නම් අදාල කාලවකවානු හා හේතු,

..........................................................................................................................................

..........................................................................................................................................

15. (අ) අයදුම්පත් කැඳවන අවසාන දිනට පූර්වාසන්න වසර පහ (05) තුළ විනය පරීක්ෂණ හෝ විනය දඬුවම් කිසිවක් ලබා තිබේද? ..........................................................................................................

(ආ) තිබේනම් ඒ පිළිබඳ විස්තර :- ....................................................................................................

..........................................................................................................................................

ඉහත සඳහන් විස්තර සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි. මෙහි සඳහන් විස්තර කිසිවක් අසත්‍ය බව හෝ වැරදි බව තෝරා ගනු ලැබීමට පෙර සොයා ගතහොත් එයින් මා නුසුදුස්සෙකු වන බවත්, පත් කිරීමෙන් පසුව සොයා ගතහොත් කිසිදු වන්දියක් නොමැතිව සේවයෙන් පහකිරීමට යටත් වන බවත් දනිමි.

..........................................

දිනය

..........................................

අයදුම්කරුගේ අත්සන

**2 කොටස: ආසන්නතම අධීක්ෂණ නිලධාරියාගේ නිර්දේශය.**

මාගේ අධීක්ෂණය යටතේ විකිරණශිල්පී .............................................. තනතුරේ සේවය කරන .................................................................................................. නිලධාරියා/නිලධාරිනිය අවශ්‍යා සුදුසුකම් සපුරා තිබේ නම් විකිරණ ශිල්පී පුහුණු පාසලේ ජ්‍යෙෂ්ඨ ආචාර්ය තනතුරට පත් කිරීම නිර්දේශ කරමි.

............................................ ..........................................................................

දිනය විශේෂ ශ්‍රේණියේ නිලධාරියාගේ/ අංශ ප්‍රධානියාගේ නිල මුද්‍රාව හා අත්සන

**3 කොටස: විෂය භාර නිලධාරියා/නිලධාරිනිය විසින් අදාල නිලධාරියාගේ/ නිලධාරිනියගේ පෞද්ගලික ලිපිගොනුව අනුව සම්පූර්ණ කළ යුතුය.**

අදාල නිලධාරියාගේ/නිලධාරිනියගේ පෞද්ගලික ලිපිගොනුව අනුව අයදුම්පතේ 1 සිට 15 දක්වා ඇති සියලු තොරතුරු නිවැරදි බව මෙයින් සහතික කරමි.

............................................ .................................................................

දිනය විෂය භාර නිලධාරියාගේ/නිලධාරිනියගේ අත්සන

**4 කොටස: පරිපාලන නිලධාරියාගේ/ නිලධාරිනියගේ නිර්දේශය**

අදාල නිලධාරියාගේ/නිලධාරිනියගේ අයදුම්පතේ 1 සිට 15 දක්වා ඇති සියලු තොරතුරු නිවැරදි බව සහතික කරමි. අයදුම්පත්‍රය නිර්දේශ කරමි.

............................................ ............................................

දිනය පරිපාලන නිලධාරියාගේ අත්සන හා නිල මුද්‍රාව

**5 කොටස: ආයතන ප්‍රධානියාගේ නිර්දේශය**

විකිරණශිල්පී................... තනතුර දරණ .................................................................................. මයා/මෙය/මිය සම්බන්ධයෙන් ඉහත දක්වා ඇති සියලු තොරතුරු නිවැරදි බවත්, ඔහු/ඇය විකිරණශිල්පී I හෝ අධි ශ්‍රේණියේ උසස්වීම .................................. දිනට ලබා ඇති බවත් සහතික කරමි. වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවාවට අයත් විකිරණශිල්පී පුහුණු පාසලේ විකිරණශිල්පී ජ්‍යෙෂ්ඨ ආචාර්ය තනතුර සඳහා ඉදිරිපත් කර ඇති මෙම අයදුම්පත නිර්දේශ කරමි.

............................................ ............................................

දිනය ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව

ඇමුණුම I

**විකිරණශිල්පී පුහුණු පාසල් සඳහා ජ්‍යෙෂ්ඨ ආචාර්ය විකිරණශිල්පී තනතුරට බඳවා ගැනීම සඳහා වන විස්තරාත්මක ලකුණු පරිපාටිය**

**01.සේවා පළපුරුද්ද**

ජ්‍යෙෂ්ඨතාවය සඳහා ලකුණු ලබා දීමේදී රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2019 අනුව මූලික සුදුසුකමට අවශ්‍ය අවම සේවා කාලයට අමතර සේවා කාලයක් සඳහා වැඩිම සේවා කාලයක් සහිත නිලධාරියාට ජ්‍යෙෂ්ඨතාවය සඳහා වෙන්කර ඇති මුළු ලකුණු ප්‍රමාණයද සෙසු නිලධාරීන්ට ඊට සමානුපාතික ලෙස අමතර සේවා කාලය සඳහා ලකුණු ලබාදීම ද සිදුකළ යුතුය.

**- උපරිම ලකුණු 60 -**

**02.අතිරේක අධ්‍යාපන සුදුසුකම්**

2.1 විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් මගින් ලබාදෙන

i. තනතුරට අදාල ක්ෂේත්‍රයේ දර්ශනපති/ දර්ශනශූරි උපාධිය සඳහා (Master of Philosophy/ Doctor of Philosophy) - ලකුණු 30

ii. තනතුරට අදාල ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධිය සඳහා - ලකුණු 25

iii. කළමණාකරන පශ්චාත් උපාධිය හෝ තොරතුරු තාක්ෂණ පශ්චාත් උපාධිය සඳහා - ලකුණු 15

2.2 විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් මගින් ලබාදෙන

i. තනතුරට අදාල ක්ෂේත්‍රයේ උපාධිය සඳහා - ලකුණු 15

ii. කළමණාකරන උපාධිය සඳහා හෝ තොරතුරු තාක්ෂණ උපාධිය සඳහා - ලකුණු 10

2.3 විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් මගින් ලබාගත් පාඨමාලා කාලය මාස 06කට හෝ පැය 72 කට නොඅඩු පාඨමාලාව (අධ්‍යාපන හා වෙනත් මූලික සුදුසුකම් යටතේ සලකා බලන ලද පාඨමාලා සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ.)

i. තනතුරට අදාල ක්ෂේත්‍රයේ වෙනත් ඩිප්ලෝමාවක් සඳහා - ලකුණු 7.5

ii. කළමණාකරන/ තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමාවක් සඳහා - ලකුණු 2.5

**- උපරිම ලකුණු 30 –**

සටහන -
- ඉහත අංක 02 යටතේ ලබාගෙන ඇති ඉහළම සුදුසුකම සඳහා **පමණක්** ලකුණු ලබාදෙනු ලැබේ.

**03. විශේෂ කුසලතාවයන්**

අදාල වෘත්තීය ක්ෂේත්‍රය පිළිබඳව ප්‍රකාශයට පත්කර ඇති විද්‍යාත්මක පර්යේෂණ ප්‍රකාශන, පොත්පත්, පුවත්පත් වල ප්‍රකාශිත ලිපි, උපදෙස් හා මග පෙන්වීම්, ජර්නල් පත්‍රිකා, සමුළු පත්‍රිකා, උද්ධෘත යනාදිය ඇගයීම් කිරීමේදී ඇමුණුම II හි නිර්ණායක වලට අනුකූලව ලකුණු ලබාදිය යුතු අතර සම්මුඛ පරීක්ෂණයේදී ඇගයීම් කරන ලද ආකාරය සම්මුඛ පරීක්ෂණ ලේඛනයේ පැහැදිලිව සඳහන්ව තිබිය යුතුය.

**- උපරිම ලකුණු 10 –**

ඇමුණුම II

<u>ප්‍රකාශන ඇගයීම් අදාල කරගත යුතු නිර්ණායක</u>

I. ප්‍රකාශන -

(අ) ජර්නල් පත්‍රිකා - සමාලෝචනයට ලක්කර අංකිත ප්‍රකාශන මාලාවක පළකරන ලද ශාස්ත්‍රීය වැදගත්කමක් සහිත සම්පූර්ණ පිටපතක් සහිත රචනයක් හෝ ලිපියක්

(ආ) සමුළු පත්‍රිකා/ උද්ධෘත/ අවසන් වශයෙන් පිටපත් කරන ලද රචනා

ශාස්ත්‍රීය වටිනාකමක් සහිත සම්මේලන, සභාවක්, සම්මන්ත්‍රණ, අධ්‍යයන සම්මේලන, සංවාද මණ්ඩප, වැඩමුළු හෝ ශාස්ත්‍රීය සම්මන්ත්‍රණ සඳහා යොදාගත් වාර්තා

II. කතෘන් කිහිපදෙනෙකුගේ සහභාගීත්වයෙන් පළකරන ලද ප්‍රකාශන සම්බන්ධයෙන් අයදුම්කරුගේ දායකත්ව ප්‍රමාණය පැහැදිලිව දක්වා තිබිය යුතු අතර, එම දායකත්ව ප්‍රමාණයට සමානුපාතිකව අයදුම්කරුට ලකුණු ලබාදෙනු ලැබේ.

III. එකම දත්ත/ පර්යේෂණ තොරතුරු මත පදනම්ව පලකරනු ලබන, බොහෝදුරට සමාන නිගමනයන්ට එළඹී ඇති ප්‍රකාශන වෙන් වෙන් ප්‍රකාශන වශයෙන් සලකා බලනු නොලැබේ. එවැනි අවස්ථා වලදී ලකුණු ලබා දීම සඳහා එක් ප්‍රකාශනයක් පමණක් සලකා බලනු ලැබේ.